// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2471/56 – 2026 ජනවාරි මස 16 වැනි සිකුරාදා – 2026.01.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2024/142

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2025.02.28 දිනැති හා අංක 2425/64 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2025.02.20 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් හෙට්ටිමුල්ල, කවුඩුගම, එස්. ඒ.ආර්.පී. සමරසිංහ මිය සහ අනෙක් පාර්ශ්වය වශයෙන් යටියන්තොට, ලැවන්ට් වත්ත, සී/ස කැළණි වැලි වැව්ලි සමාගම අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 12/2025 හා 2025.11.07 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2026 ජනවාරි මස 02 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණය සහ කාර්මික අධිකරණ ශාඛාව - කොළඹ

නඩු අංකය - A/12/2025
ගොනු අංකය - IR/COM/02/2024/142

එස්. ඒ. ආර්. පී. සමරසිංහ මිය,
කවුඩුගම,
හෙට්ටිමුල්ල.

පළමු පාර්ශ්වය

සහ

සී/ස කැළණි වැලි සමාගම.
ලැවන්ට් වත්ත.
යටියන්තොට.

දෙවන පාර්ශ්වය

අතර පවත්නා කාර්මික ආරාවුල

**ප්‍රදානය**

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මැතිතුමා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන ) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය අනුව ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතිඥ ආර්. නවෝදයම් වන මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වශයෙන් දී ඇත්තේ,

“කම්කරු විනිශ්චය සභා නියෝගය (KE/42/824/2012) අනුව 2019.04.01 දින සිට සේවයේ පුනපත් කළ යුතු එස්. ඒ. ආර්. පී. සමරසිංහ මිය සබරගමුව පළාත්බද මහාධිකරණ තීන්දුවෙන් (HC Kegalle case No. 5508/2019/Appeal) අනතුරුව 2021.02.15 දින නැවත සේවයේ පිහිටුවීමේ දී නියමිත වැටුප් තලයේ නොපිහිටුවීමෙන් ඇයට අසාධාරණයක් සිදු වී තිබේ ද යන්න හා එසේ නම් ඇයට හිමි විය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.

ඒ අනුව මෙම නඩුව 2025.03.25 දින කැඳවූ අවස්ථාවේ දී පළමු පාර්ශ්ව ඉල්ලුම්කාරිය වෙනුවෙන් නීතිඥ නියෝජනයක් ඉදිරිපත් නොවූ අතර දෙවන පාර්ශ්වය වන වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් සී/ස කැළණි වැලි සමාගමේ යටියන්තොට ලැවැන්ට් වත්ත වෙනුවෙන් එහි වතු අධිකාරි සාලින්ද සමරකෝන් මහතා සමඟ නීතිඥ අනුරාධ කඳන්හේන මහතා පෙනී සිට ඇත.

එහි දී පළමු පාර්ශ්වය වන, ඉල්ලුම්කාරිය ගරු බේරුම්කරණයට කරුණු දක්වමින් ප්‍රකාශ කර සිටියේ “තමා සී/ස කැළණිවැලි සමාගමේ යටියන්තොට ලැවැන්ට් ස්ටේට් වත්තේ ලිපිකාරිනියක් වශයෙන් 1998.07.01 දින සිට සේවයට බැඳුනු බවත් 2003 වන තෙක් එහි කැළණිවැලි සමාගමේ හල්ගොල්ල වතුයායේ සේවය කළ බවත් ඉන් පසු එම වතුයායේ පරිපාලනය විසින් චෝදනා 07 ක් යටතේ විනය පරීක්ෂණයක් පවත්වා 2012.06.18 දින තමා සේවයෙන් පහ කරන ලද බවත් එලෙස තමා සේවයෙන් පහ කිරීමට එරෙහිව කෑගල්ල කම්කරු විනිශ්චය සභාව විසින් ලබා දුන් අංක 42/824/2012 යටතේ නඩුවක් පැවරූ බවත් එම නඩුවේ නියෝගය අනුව මා 2019.04.01 දින සිට නැවත සේවයේ පිහිටු විය යුතු බවත් කෙසේ වුව ද කම්කරු විනිශ්චය සභාවේ එම නියෝගයට විරුද්ධව වතු පාලන අධිකාරිය විසින් කෑගල්ල මහාධිකරණයේ අංක 3508/2019(Appel) යටතේ අභියාචනාවක් ගොනු කරන ලද බවත් එම අභියාචනය මහාධිකරණය මඟින් නිශ්ප්‍රභා කිරීම හේතුවෙන් 2021.02.15 දින සිට එකී ඉල්ලුම්කාරිය කැළණි වැලි සමාගමේ ලැවැන්ට් වත්තේ සේවයෙහි පිහිටුවන ලද බවත්ය.

පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කාරිය වැඩිදුරටත් ගරු බේරුම්කරණය ඉදිරියේ ප්‍රකාශ කර සිටියේ කෑගල්ල කම්කරු විනිශ්චය සභාවේ සහ කෑගල්ල මහාධිකරණයේ නියෝගය පරිදි දෙවන පාර්ශ්වයේ වගඋත්තරකරුවන් කටයුතු නොකර තමාගේ 1998.07.01 දින සිට

2021.02.15 දින දක්වා වසර විසිපහක පමණ සේවා කාලය සැලකිල්ලට නොගෙන තමා කනිෂ්ඨ ලිපිකාර සේවයේ පිහිටුවන ලද බවත් තමාට නියමිත වැටුප් තලයේ නොපිහිටුවීමෙන් එනම් රු. 44,562.10 (හතළිස් හතර දහස් පන්සීය හැට දෙකයි ශත දහයක) ක වැටුප් තලයේ නොපිහිටුවා ඊට වඩා අඩු රු.30,125.00 ක (තිස් දහස් එකසීය විසි පහක ) වැටුප් තලයේ පිහිටුවීම නිසා හිඟ වැටුප ලෙස රු.1,413,966.67 ක (දාහතර ලක්ෂ දහතුන් දහස් නවසීය හැට හයයි ශත හැට හතක) මුදලක් තමාට දෙවන පාර්ශ්වය විසින් ගෙවීමට නියමිතව ඇති බවත්ය.

වර්ෂ 2025.07.24 දින මෙම නඩුව විභාගයට ගත් අවස්ථාවේ දී පළමු පාර්ශ්වය වෙනුවෙන් නීති ආධාර කොමිෂන් සභාවේ උපදෙස් මත නිතීඥ දීපාල් ආරච්චිගේ මහතා පෙනී සිට ඇති අතර දෙවන පාර්ශ්වය වෙනුවෙන් නිතීඥ අනුරාධ කඳන්හේන මහතා පෙනී සිට ඇත.

එදින දෙවන පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නිතීඥ කඳන්හේන් මහතා කරුණු දක්වමින් ප්‍රකාශ කර සිටියේ හිඟ වැටුප් ගණනය කිරීම 2012 ජූනි මස සිට 2019 මාර්තු මාසය දක්වා මෙම ඉල්ලුම්කාරිය විසින් පවරණ ලද කම්කරු විනිශ්චය සභා නඩුව පැවැති කාල සීමාවේ දී ඇයට වාර්ෂික වැටුප් වර්ධක හිමිවේද යන්න සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය අතර නිශ්චිත එකඟතාවයක් නොමැති බවත් ඒ සම්බන්ධයෙන් සාමූහික ගිවිසුම පරීක්ෂා කර බලා නිශ්චිත එකඟතාවයකට එළඹීමෙන් අනතුරුව වර්තමාන වැටුප් තලයේ ප්‍රමාණය කුමක් ද යන්න තීරණය කිරීමට තවදුරටත් කාල වකවානුවක් අවශ්‍ය වූ බව දන්වා සිටී. එබැවින් ඒ සම්බන්ධයෙන් දෙපාර්ශ්වයම නිශ්චිත තිරණයක් ගැනීමට දෙපාර්ශ්වයටම දිනයක් ලබා දෙන ලදි.

වර්ෂ 2025.09.30 දින මෙම නඩුව කැඳවූ අවස්ථාවේ දී පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කාරිය වන රංගිකා සමරසිංහ පැමිණ සිටි අතර ඇය වෙනුවෙන් නීති ආධාර කොමිෂන් සභාවේ නිතීඥ දීපාල් ආරච්චිගේ මහතා ද දෙවන පාර්ශ්වය වෙනුවෙන් ලැවැන්ට් වත්තේ අධිකාරි සාලින්ද සමරකෝන් මහතා ද ඔහු වෙනුවෙන් නිතීඥ අනුරාධ කඳන්හේන මහතා පෙනී සිට ඇත.

එදින මෙම බේරුම්කරණය මීට පෙර අවස්ථාවලදී සාකච්ඡා කළ පරිදි අවසන් සමථයකට එළඹ ඇති අතර ඒ අනුව පළමු පාර්ශ්වයට එකඟ වී ඇති සම්පූර්ණ මුදල සඳහා චෙක්පත් හතරක් දෙවන පාර්ශ්වය විසින් ගෙනවිත් ඇත.

එම චෙක්පත් හතරෙහි විස්තර මෙසේ ය.

| | | | | |
|---|---|---|---|---|
| 1. | පාරිතෝෂික මුදලේ හිඟ මුදල | චෙක්පත් අංක | 547827 | රු. 251,150.35 |
| 2. | හිඟ වැටුප් | චෙක්පත් අංක | 547826 | රු. 793,615.86 |
| 3. | වෛද්‍ය දීමනා හිඟ මුදල් | චෙක්පත් අංක | 547828 | රු. 79,361.56 |
| 4. | අතිකාල දීමනා | චෙක්පත් අංක | 547829 | රු. 170,769.49 |

තව ද, සේවක අර්ථ සාධක අරමුදලේ හිඟ මුදල වන රු. 95,233.90 ක මුදල හා සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදලේ හිඟ මුදල වන රු. 23,808.48 ක මුදල මේ වන විටත් ගිණුම් ගත කොට ඇති බවත් දෙවන පාර්ශ්වය විසින් ප්‍රකාශ කර සිටින ලදී.

කෙසේ වුවත් පළමු පාර්ශ්වය වන ඉල්ලුම්කාරිය විසින් 2025.08.28 දිනෙන් පසුව කෑගල්ල කම්කරු විනිශ්චයාධිකාරියේ ඇයගේ සේවය අසාධාරණ ලෙස අවසන් කර ඇති බවත් එම ඉල්ලුම්පත්‍රය පළමු පාර්ශ්වය විසින් ඉල්ලා අස්කර ගැනීමෙන් පසුව ඉහත සඳහන් නියමිත මුදල් ගෙවා මෙම නඩුව ඉල්ලා අස්කර ගැනීමට දෙපාර්ශ්වය එකඟතාවය පළ කර සිටින හෙයින් වෙනත් දිනයක් ලබා දෙන ලදි.

මෙම නඩුව අවසාන වශයෙන් මෙම බේරුම්කරයේ 2025.10.27 දින කැඳවූ අවස්ථාවේ දී පළමු පාර්ශ්වය පෙනී සිට ඇති අතර ඇය වෙනුවෙන් නීති ආධාර කොමිෂන් සභාවේ උපදෙස් මත නිතීඥ දීපාල් ආරච්චිගේ මහතා පෙනී සිට ඇත.

දෙවන පාර්ශ්ව ආයතනය වෙනුවෙන් වතු අධිකාරි සාලින්ද සමරකෝන් මහතා සමඟ නිතීඥ අරුන්දති දිවිසේකර මෙනවිය පෙනී සිට ඇත.

එදින පළමු පාර්ශ්වය දැනට කෑගල්ල කම්කරු විනිශ්චය සභාවේ දෙවන පාර්ශ්වයට විරුද්ධව පවරා ඇති නඩුව ඉල්ලා අස් කර ගන්නා බවට මෙම විනිශ්චය සභාවේ සහකාර ලේකම් විසින් නිකුත් කරන ලද සහතික පිටපතක් ඉදිරිපත් කරන ලදි.

පලමු පාර්ශ්වය වන ඉල්ලුම්කාරිය සහ ඇයගේ නිතීඥවරයා විසින් රු. 1,413,966.67 (රුපියල් දාහතර ලක්ෂ දහතුන් දහස් නවසිය හැට හතයි ශත හැට හතක්) සහ 2024 වර්ෂයේ අවසානය දක්වා අතිකාල දීමනා ලෙස රු. 11,793.27 කට (රුපියල් එකොළොස් දහස් හත්සිය

අනු තුනයි ශත විසි හතක්) අදාළ චෙක්පත් පරික්ෂා කර බලා ඒවා නිවැරදි බව පිළිගෙන පළමු පාර්ශ්වයේ සමරසිංහ මහත්මිය ද දෙවන පාර්ශ්වය වෙනුවෙන් වතු අධිකාරි සාලින්ද සමරකෝන් මහතා ද නඩු පොතේ අත්සන් තබන ලදී.

ඒ අනුව මෙම ආරාවුලේ සියලුම නඩු කටයුතු අවසන් කරමි. මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව ද තීරණය කරමි.

**නිතීඥ ආර්. නවෝදයම්,**
බේරුම්කරු.

2025 නොවැම්බර් මස 07 වැනි දින දී ය.

EOG 101 - 0155

---

මගේ අංකය: IR/COM/01/2023/261

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2025.04.04 දිනැති හා අංක 2430/32 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2025.03.25 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් අක්මීමන, කපුහෙම්පල සේනානායක මාවත, විජය නිවස හි පදිංචි කේ. ඒ. එන්. වී. අබේරුවන් මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, ජාවත්ත පාර, අංක 99/1 හි පිහිටි ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A19/2025 හා 2025.11.25 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2026 ජනවාරි මස 02 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05.

**බේරුම්කරණය හා කාර්මික අධිකරණය - කොළඹ**

කේ. ඒ. එන්.වී. අබේරුවන් මයා,
විජය නිවස,
සේනානායක මාවත,
කපුහෙම්පල,
අක්මීමන.

*පැමිණිලිකරු*

ආරාවුල් අංකය - IR/COM/01/2023/261
බේරුම්කරණ අංකය - A/19/2025

එදිරිව

ජාතික ගෙඩනැගිලි පර්යේෂණ සංවිධානය,
අංක 99/1,
ජාවත්ත පාර.
කොළඹ 05.

*වගඋත්තරකරු*

**බේරුම්කරණ තීන්දු ප්‍රකාශය**

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මහතා 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ:

"ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වාස්තු විද්‍යාඥවරයෙකු ලෙස සේවය කරන කේ. ඒ. එන්. වී. අබේරුවන් මහතාට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 23/2013 හි සඳහන් ක්ෂේත්‍ර කටයුතු දීමනාව ලබා ගැනීම සඳහා හිමිකමක් තිබේ ද, එසේ හිමිකමක් තිබේ නම් එම දීමනාව 2023 ජනවාරි මස දක්වා නොගෙවීමෙන් අසාධාරණයක් සිදු වී තිබේ ද යන්න සහ එසේ නම් ඔහුට හිමි විය යුතු සහන කවරේ ද යන්න පිළිබඳ වේ."

**පළමු පාර්ශ්වයේ නෛතික ස්ථාවරය:**

පළමු පාර්ශ්වය විසින් දිවුරුම් ප්‍රකාශ මගින් සාක්ෂි ලබා දෙමින් සහ ලිඛිත දේශන මගින් පහත ස්ථාවරයන් ප්‍රකාශ කොට ඇත.

පැමිණිලිකාර පළමු පාර්ශ්වය ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වාස්තු විද්‍යාඥ තනතුරට 2015.06.15 වෙනි දින පත් කර ඇති අතර එකී පත්වීම 2013.01.01 දිනයට පසුදාතම කර ඇත. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 28/2011 අනුව රාජ්‍ය සේවයේ නියුතු ඉංජිනේරුවන් හට රු. 15,000.00 ක මාසික ක්ෂේත්‍ර දීමනාවක් අනුමත කර තිබූ අතර එකී චක්‍රලේඛය වාස්තු විද්‍යාඥයන්ට ද අදාළ වන සේ නව චක්‍රලේඛයක් 23/2013 අංක යටතේ නිකුත් කළ බවත් ඒ අනුව වාස්තු විද්‍යාඥයින්ට එකී ක්ෂේත්‍ර දීමනාව 2013.04.01 දින සිට ගෙවීම ක්‍රියාත්මක විය යුතු බවත්, වග උත්තරකාර ආයතනය විසින් එකී චක්‍රලේඛයේ සඳහන් "වාස්තු විද්‍යාඥ" යන්න "වරලත් වාස්තු විද්‍යාඥ" ලෙස හා "ක්ෂේත්‍ර දීමනාව" යන්න "වෘත්තිය දීමනාව" ලෙස කූඨ ලෙස අර්ථ ගන්වමින් මෙම දීමනාව පැමිණිලිකරු හට ගෙවීම චේතනාන්විතව පැහැර හැරී ඇති බවත්ය.

තවද, මෙම දීමනාව වරලත් වාස්තු විද්‍යාඥයින්ට පමණක් ගෙවීම සඳහා 2018.01.23 වන දින අන්තර් පාලන කමිටු පත්‍රිකා අංක 06-01/2018 යනුවෙන් ඉදිරිපත් කර එක් අයෙකු හට පුද්ගලික වන සේ අනුමත කර ගෙවීම් කර ඇත. තවද එකී පත්‍රිකාව ඉදිරිපත් කිරීමේ දී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පිළිබඳව සඳහනක් සිදු නොකර අමාත්‍ය මණ්ඩල තීරණය ගන්නා ලද 2013.07.25 සහ පත්‍රිකා අංකය වන 13/1010/558/019 යන්න හා ක්‍රියාත්මක වන දිනය වන 2013.04.01 යන්න පමණක් සඳහන් කර ඇති අතර එම දිනයන් සහ අංක ඉතා පැහැදිලිව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 23/2013 හා සමාන බවත් ය.

පළමු පාර්ශ්වය කියා සිටිනුයේ පැමිණිලිකරු වාස්තු විද්‍යාඥයකු වන බවත්, ඒ බව පැමිණිල්ලේ ඇ.01 හා ඇ.02 ඇමුණුම් මගින් හා වගඋත්තරකාර ආයතනයේ V - 01 ලේඛනය මගින් ද තහවුරු කර ඇති බවත් එකී තනතුර 2013.01.01 දින සිට ක්‍රියාත්මක විය යුතු බවත් ය. තවද පැමිණිලිකරු සිය දිවුරුම් ප්‍රකාශය මගින් ඉදිරිපත් කර ඇති ඇමුණුම් අංක 01 සිට 10 දක්වා වූ ලේඛන වගඋත්තරකාර ආයතනය විසින් ලිඛිතව හෝ වාචිකව ප්‍රතික්ෂේප කර නොමැති බවත් දක්වා සිටියි.

පළමු පාර්ශ්වය ප්‍රකාශ කර සිටිනුයේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 23/2013 මෙහි පැමිණිලිකරුට ද අදාළ වන බවත් වගඋත්තරකාර පාර්ශ්වය විසින් ගොනු කර ඇති V-4 සහ V-9 ලේඛන අනුව මෙම චක්‍රලේඛ පැමිණිලිකරුට අදාළ වන බව තහවුරු කර ඇති බවත් එමගින් නීතියේ *Res ipsa loquitur* මූලධර්මය සංස්ථාපනය කරන බවත් ය.

තවද පළමු පාර්ශ්වය ප්‍රකාශ කර සිටිනුයේ පැමිණිලිකරු දිගින් දිගටම සිදු කරනු ලැබූ ඉල්ලීම්වල ප්‍රතිඵලයක් වශයෙන් වගඋත්තරකාර ආයතනය එකී ඉල්ලීමෙහි නෛතිකභාවය පිළිගනිමින් 2023.05.15 දිනැති ලිපිය මගින් මෙම දීමනාව 2023.02.21 වන දින සිට ගෙවීමට කටයුතු කරන බව දන්වා ඇති බවත් මෙම කරුණ බේරුම්කරණ විභාගය අතර තුර දී V-9 ලෙස ඉදිරිපත් කර වගඋත්තරකාර පාර්ශවය පිළිගෙන ඇති බවත්ය.

තවද, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය යනු ස්වයං මූල්‍ය උත්පාදන රාජ්‍ය ව්‍යාපාරයක් වන බවත්, වැටුප් හෝ දීමනා ගෙවීම සඳහා මුදල් අමාත්‍යාංශයෙන් හෝ මහා භාණ්ඩාගාරයෙන් කිසිදු ප්‍රතිපාදනයක් ලබා නොදෙන අතර මෙකී ආයතනයේ මූල්‍ය කළමනාකරණය පිළිබඳව මාර්ග උපදේශනයක් පමණක් ලබා දෙන බවත්ය.

එබැවින් මෙම දීමනාව 2023.02.21 දිනට ලඝු කිරීම සාධාරණ නොවන බවත් එකී දීමනාව 2013.04.01 දින සිට 2023.02.23 දින දක්වා වන මාස 123 කාලයක් සඳහා මසකට රුපියල් 15,000.00 බැගින් රුපියල් 1,845,000.00 ක හිඟ මුදල පළමු පාර්ශ්වයට ගෙවන ලෙසත් ය.

**දෙවන පාර්ශ්වයේ නෛතික ස්ථාවරය:**

දෙවන පාර්ශ්වය සාක්ෂි ලබා දෙමින් සහ ලිඛිත දේශන මගින් පහත ස්ථාවරයන් ප්‍රකාශ කොට ඇත.

පැමිණිලිකාර පළමු පාර්ශ්වකරු වන කේ. ඒ. එන්. වී. අබේරුවන් මහතා 1991.03.01 දින සිට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ සේවය කළ බවත්, ඔහුට 2015.06.15 දින සිට AR1 ශ්‍රේණියේ විද්‍යාඥ සේවා කාණ්ඩය යටතේ වාස්තු විද්‍යාඥයෙක් ලෙස උසස්වීමක් ලබා දී ඇති බවත්, අනතුරුව 2022.02.17 දිනැති ලිපිය මගින් 2013.01.01 දිනට ක්‍රියාත්මක වන පරිදි AR1 තනතුරට පසුදාතම සිදුකර ඇති බවත්, එකී පසුදාතම කිරීම සිදුකර ඇත්තේ කළමනාකාර සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබා දී ඇති 2020.12.03 හා 2021.10.26 දිනැති ලිපි සැලකිල්ලට ගැනීමෙන් බවත්ය.

වගඋත්තරකාර දෙවන පාර්ශ්වය වැඩිදුරටත් ප්‍රකාශ කර සිටිනුයේ එකී පසුදාතම කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් විමර්ශනයක් සිදු කළ බවත්, එකී විමර්ශනය අනුව AR1 තනතුර 2014.12.01 දින සිට ක්‍රියාත්මක විය යුතු බවත්. ඒ සඳහා 2025.01.31 දින පැවති අන්තර්වාර කළමනාකරණ කමිටුවේ අනුමැතිය ලබා දී ඇති බවත් ඒ අනුව කේ. ඒ. එන්. වී. අබේරුවන් මහතාගේ AR1 තනතුර ලබාදුන් දිනය 2014.12.01 වශයෙන් ක්‍රියාත්මක වන බවත් ය.

වගඋත්තරකාර දෙවන පාර්ශ්වය කියා සිටින්නේ රජයේ වාස්තු විද්‍යාඥ සේවයේ නිලධාරීන් සඳහා ක්ෂේත්‍ර දීමනාවක් වශයෙන් රුපියල් 15,000.00 ක් 2013.04.01 දින සිට ගෙවීමට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 23/2013 අනුව තීරණයක් ගෙන තිබූ බවයි. 2013 අප්‍රේල් මාසයේ දී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වාස්තු විද්‍යාඥයින් කිසිවෙක් සේවයේ නොසිටි බවත්, එබැවින් මෙම ගෙවීම සඳහා අනුමැතිය ලබා ගැනීමේ අවශ්‍යතාවයක් එම අවස්ථාවේ දී ඇති නොවූ බවත්ය.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක අර්ධ රාජ්‍ය ආයතනයක් වන බවත්, සේවකයින්ගේ වැටුප් හා අනෙකුත් සියළුම දීමනා ගෙවීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන අනුමැතිය හා චක්‍රලේඛවලට අනුකූලව සිදුකරනු ලබන බවත්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් නිර්දේශ කරනු ලබන වැටුප් හා අනෙකුත් දීමනා අදාළ වන්නේ රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ගණයට වැටෙන පූර්ණ රාජ්‍ය ආයතනවලට පමණක් වන බවත්ය.

පැමිණිලිකාර පළමු පාර්ශ්වය 2021 වර්ෂයේ දී වාස්තු විද්‍යාඥයින් සඳහා ගෙවන රුපියල් 15,000.00 දීමනාව ලබා දෙන ලෙස සිදු කළ ඉල්ලීම සලකා 2021.09.14 දින පැවති අන්තර්වාර කළමනාකරණ කමිටුව වෙත පත්‍රිකාවක් මගින් 23/2013 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් ලබාදෙන වාස්තු විද්‍යාඥ දීමනාව ගෙවීම සඳහා අනුමැතියට ඉදිරිපත් කළ අතර එවකට රටේ පැවති මූල්‍ය සීමාවන් සලකා එම යෝජනාවට අනුමැතිය ලබාදීම ප්‍රතික්ෂේප කළ බවත්, නැවතත් 2023.01.31 වන දින අන්තර්වාර කළමනාකරණ කමිටුවට ඉහත යෝජනාව ඉදිරිපත් කළ බවත් එහි දී ද අනුමැති ලබා දීම ප්‍රතික්ෂේප වූ බවත්. එසේ වුවත් 2023.02.21 වන දින පැවති අන්තර්වාර කළමනාකරණ කමිටුවට මෙම ඉල්ලීම සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කර ආයතනයේ සේවයේ නිරතව ඇත්තේ එක් වාස්තු විද්‍යාඥයෙකු බැවින් එම නිලධාරියා සඳහා මසකට රු. 15,000.00 ක් ගෙවීම හේතුවෙන් ආයතනයේ මූල්‍ය තත්ත්වයට දැඩි බලපෑමක් ඇති නොවන බවත් අවධාරණය කිරීමෙන් පසු පළමු පාර්ශ්වය වෙත වාස්තු විද්‍යාඥයින් සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 23/2013 හි සඳහන් ක්ෂේත්‍ර ක්‍රියාකාරම් දීමනාව ගෙවීමට 2023.02.21 දින පැවති අන්තර්වාර කළමනාකරණ කමිටුවේ දී අනුමැතිය ලබාදුන් බවත්ය. ඒ අනුව පළමු පාර්ශ්වය සඳහා 2023.02.21 දින සිට සේවයෙන් ඉල්ලා අස්වූ 2025 ජනවාරි මාසය දක්වා ගෙවීම් සිදුකර ඇති බවත්ය.

තවද, 23/2013 චක්‍රලේඛයේ සඳහන් දීමනා ගෙවීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විධිමත් අනුමැතිය ලබාදී නොමැති අවස්ථාවක දී එමෙන්ම අන්තර්වාර කළමනාකරණ කමිටුව අනුමැතිය ලබාදුන් දිනයට පෙර කාල සීමාව සඳහා හිඟ දීමනා ගෙවීමට හැකියාවක් නොමැති බවත්ය.

**තීන්දුව**

පැමිණිලිකාර පළමු පාර්ශ්වයේ කේ. ඒ. එන්. වී. අබේරුවන් මහතා AR1 ශ්‍රේණියේ විද්‍යාඥ සේවා කාණ්ඩය යටතේ වාස්තු විද්‍යාඥයෙක් ලෙස 2015.06.15 දින සිට උසස්වීමක් ලබා දී ඇති බවත්, එකී උසස් වීම 2013.01.01 දිනට ක්‍රියාත්මක වන පරිදි පසුදාතම සිදුකර ඇති බවත්, එකී පසුදාතම කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් විමර්ශනයක් සිදු කළ බවත්, එකී විමර්ශනය

අනුව AR1 තනතුර 2014.12.01 දින සිට ක්‍රියාත්මක වන විය යුතු බවත්, ඒ අනුව කේ. ඒ. එන්. වී. අබේරුවන් මහතාගේ AR1 තනතුර ලබාදුන් දිනය 2014.12.01 වශයෙන් ක්‍රියාත්මක වන බවත් තීරණය කරමි.

පළමු පාර්ශ්වය වෙත වාස්තු විද්‍යාඥයින් සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 23/2013 හි සඳහන් ක්ෂේත්‍ර ක්‍රියාකාරම් දීමනාව ගෙවීමට 2023.02.21 දින පැවති අන්තර්වාර කළමනාකරණ කමිටුවේ දී අනුමැතිය ලබා දී ඇති බැවින් එකී දීමනාව සඳහා පළමු පාර්ශ්වයට හිමිකමක් ඇති බව තීරණය කරමි.

පළමු පාර්ශ්වයේ AR1 තනතුර 2014.12.01 දින සිට ක්‍රියාත්මක වන බැවින් එකී තනතුර වෙනුවෙන් ලැබිය යුතු ක්ෂේත්‍ර දීමනාව පළමු පාර්ශ්වය විසින් දැනටමත් උපයා ගෙන ඇති හිමිකමකි. මෙහි දී ශ්‍රේෂ්ඨාධිකරණය මගින් විනිශ්චිත *Sri Lankan Airlines Limited vs. Sri Lankan Airlines Aircrafts Technicians Association & Others* [SC Appeal No. 79/2013 decided on 12/03/2018] නඩුව කෙරෙහි අවධානය යොමු කරමි.

මෙම නඩුවේ දී ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් 13 වෙනි මාසය සඳහා වන ප්‍රසාද දීමනාව (The 13 month bonus) ගෙවීම අත්හිටුවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගුවන් සමාගමේ ගුවන්යානා කාර්මික ශිල්පීන්ගේ සංගමය විසින් පවරන ලද කාර්මික ආරාවුල පිළිබඳව අවධානය ලක් කළ අතර බේරුම්කරු ටී. පියසෝම මහතා විසින් ලබාදුන් තීන්දුව සලකා බැලීමක් සිදු කරන ලදී. එහි දී බේරුම්කරුගේ තීරණය වූයේ 13 වෙනි මාසය ලෙස ගෙවනු ලබන ප්‍රසාද දීමනාව හුදෙක්ම ප්‍රසාද දීමනාවක් නොවන බවත් සේවකයින් සේවා මුර ක්‍රමයට (roster cycles) රාජකාරී කිරීම නිසා ඔවුන් අතිරේක චන්ද්‍ර මාසයක් සේවයේ යෙදෙන බැවින් එය සේවකයන් විසින් උපයාගන්නා ලද දීමනාවක් බවත් ය. මෙම තීන්දුව අභියෝගයට ලක් කිරීමේ දී ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කරනු ලැබුවේ බේරුම්කරු විසින් ලබා දී ඇති නියෝගය නිවැරදි බවත්. 13 වෙනි මාසය සඳහා වන ප්‍රසාද දීමනාව යනු සේවකයින් ඒ වන විටත් උපයා ඇති ලැබීමක් වන අතර එය අහිමි කිරීමට වග උත්තරකාර ආයතනයට නොහැකි බවත්ය.

ඉහත නඩු තීන්දුවේ හරය සැලකීමට ගැනීමේ දී මෙම නඩුවේ පළමු පාර්ශ්වය ඉල්ලා සිටින හිඟ දීමනා යනු ඔහු විසින් දැනටමත් උපයා ගෙන ඇති වරප්‍රසාදයක් වන අතර එය නොගෙවා සිටීමට වගඋත්තරකාර ආයතනයට හිමිකමක් නොමැත. ඒ අනුව පැමිණිලිකාර පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරු හට සිය AR1 තනතුර ලබාදුන් 2014.12.01 දින සිට මාසිකව විශ්‍රාමගත් දින දක්වා මසකට රුපියල් 15,000.00 ක්ෂේත්‍ර දීමනාව ලබා ගැනීමට හිමිකමක් ඇති බවට තීරණය කරමි.

වගඋත්තරකාර දෙවන පාර්ශ්වය එකී දීමනාව 2023.02.21 දින සිට සේවයෙන් ඉල්ලා අස්වූ 2025 ජනවාරි මාසය දක්වා ගෙවා ඇති බැවින් 2014.12.01 දින සිට 2023.02.21 වන දින දක්වා මාස 98 ක කාලයක් සඳහා මසකට රුපියල් 15,000.00 බැගින් වන සේ රු. 1,470,000.00 ක (දාහතර ලක්ෂ හැත්තැදාහ) මුදලක් මෙම නියෝගය *ගැසට් පත්‍රයේ* පළ වී දින 30ක් ඇතුළත සහකාර කම්කරු කොමසාරිස් නැගෙනහිර කොළඹ කම්කරු කාර්යාලය වෙත ගෙවන මෙන් දෙවන පාර්ශ්වයේ වගඋත්තරකාර ආයතනය වන ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයට මෙයින් නියම කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවට තීරණය කරමි

**නීතිඥ පියල් දර්ශන ගුරුගේ,**
බේරුම්කරු.

2025 නොවැම්බර් මස 07 වැනි දින දී ය.

EOG 01 - 0156

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.